


ධම්මික විජේසිංහ
සුබෝධා ජ්‍යොතිශ සේවය - මෙල්බර්න්




# කේන්ද්‍රයෙන් කිවහැකි දේ

නිවැරදි ජ්‍යොතිශ දැනුමක් නිවැරදි ලෙස සාදන ලද කේන්ද්‍ර සටහනක් එක්තැන් වූ විට ඉන් පලාපල කීමේදී අතිශය සාර්ථක ප්‍රතිඵල අත්වේ. මෙය සානථ කිරීමට මේ වෙසක් සමයේ කාලීනව වැදගත් වන බුදුරජාණන් වහන්සේගේ අනුමාන කේන්ද්‍රයක් සලකා බලමු. (විවිධ අනුමාන කේන්ද්‍ර හා මත ඇති බව කිව යුතුයි) මෙම කේන්ද්‍රයට අනුව උන්වහන්සේ වෙසක් පුර පසලොස්වකදා කටක ලග්නයෙන් හා විසා නැකතින් උපත ලබා ඇත. ඒ අනුව චන්ද්‍රයා 4 වැන්නේ තුලාවේ වෙයි. (විසා නැකතේ අන්තිම පාදයේ නම් වෘෂ්චිකයේද විය හැකි වුවත් ලග්නාධිපති චන්ද්‍රයා නීච වී ශ්‍දාන යෝග, භංග වන නිසා තුලාවේම යැයි කිව හැක.) ඒ අනුව අනුමාන කේන්ද්‍ර සටහන පහත දැක්වේ.

"ජීවිතය හා ග්‍රහයෝ" ග්‍රන්ථයේ කතුවර හෙන්ද්‍රික් ද




සිල්වා හෙට්ටිගොඩ ශූරීන් ඉදිරිපත් කරන ලද අනුමාන සිදුහත් කේන්ද්‍රය

සතර කේන්ද්‍රයේ ගුරු, ශනි, කුජ හා රවි උච්චව ඇති නිසා චක්‍රවතී රාජ යෝගය යෙදුනද ලග්නාධිපති චන්ද්‍රයා සතුරු රාශිගතව පාපයෝගී වීමෙන් බල රහිත වේ. (9) පුන්‍ය ස්ථාන අධිපති ගුරු ලග්නයේ පසු රාහුල කුමාරෝප්පත්තිය වයස 29 දී සිදුවීමෙන් එය සනාථ වේ. ශනිගේ කුජ අන්තර් දිශාවේ පවුලෙන් වෙන්වී, රාහු අන්තර් දශාවේදී තැන් තැන් වල ගත කරමින් දුෂ්බර ක්‍රියා කොට ගුරු ගේ අන්තරයේදී දුක් අතැර මධ්‍යම ප්‍රතිපදාවට එළඹීම සිදුවිය. වයස 35 දී බුධ මහ දශාවේදී සම්බුද්ධත්වයට පත්විය. බුධගේ බුධ හා කේතු අතුරු දශාබල ශාස්ත්‍රිය හා විද්‍යා කටයුතු වල නියැලෙමින් රජගහනුවර ඉසිපතනාරාමයේ වස් වැසීමත්, කිවිගේ අතුරු දශාවේදී රෝගීන්ට උපස්ථානය, විශාලා මහ නුවර රෝග භය දුරු කිරීම් ආදී මහජන සුභ සෙතට අදාල වැඩවල යෙදීමත් ඒ අනුව සිදුවී ඇත.

මෙම කේන්ද්‍රයට බුධ මහ දශාවේ බලවත්ම අන්තරය වන රවිගේ අන්තරයේදී තව්තිසා දෙව්ලොව වැඩීමත් අශුභ පල දෙන කුජගේ අන්තරයේදී භෙෂකලා වනයේ විසීමත්, රාහු අතුරේදී වර්ගයාගෙන් වෙන්වී -පාරිලෙය්‍ය"වනයේ විසීමත් එලෙසින්ම සිදුව ඇතිබව පෙනේ. ශුභ වූ බැවින් පින්වන්ත වේ. චර රාශියක් වූ කටකයේ උපන් නිසාත්, ලග්නාධිපති චන්ද්‍රයා චර රාශියක් වූ 4 වැන්නේ සිටි නිසාත්, ස්ථිර පදිංචියක් නැතිව තැන් තැන්වල සංචාරයට හේතුවේ.

ඉහත කී පරිදි චන්ද්‍රයා සතුරු රාශියක පාප යෝගීව ශුභයෙකුට නොපෙනී සිටීමත් මවුට තදබල අපලයි. ඕ තොමෝ උන්වහන්සේ ඉපදී දවස් 7කින් කාලක්‍රියා කලාය. 7 අධිපති 4 සිටීම ස්වාමිභක්තියෙන් පතිවෘතාව ආරක්‍ෂා කරන උතුම් භාර්යාවක් ලැබීමට හේතු විය. නමුත් කුජ 7හි වීමෙන් විවාහයෙන් වෙන් වීමට හේතු වුවත්, උච්චව සිටීම නිසා කනවැන්දුම් වීමක් නොවීය.
ගුරු ලග්නයේ උච්චව සිටීහ නිසා අංග සම්පූර්ණ ශරීරයක් ලැබිණි.

මී ලගට නක්‍ෂත්‍ර දසා ක්‍රමය අනුව බැලීමේදී විසා නැකතින් උපන් බැවින් මහ දශාව ගුරුගේ බව කිව හැක. නැකතේ මුලදීම උපන් බව පෙනෙන්නේ ශිල්ප හැදෑරීම, විවාහය ආදී සුභ කටයුතු සොලොස්වන විය වන විට ඉටු වී ඉතා සැපවත් ව ජීවිතය ගත කල බැවිනි. දාහත් වැනි වියේදී ශනිගේ මහ දශාව ලබා තිබේ. දුකට අධිපති බැවින් ද 4 වැන්න හා චන්ද්‍රයා සමඟ වීමෙන් හිතද සම්බන්ධවන නිසා කාමභෝගී ජීවිතයෙන් ඈත් වීමක් වෙයි. විවාහ වී 13 වසරකට ගුරුගේ අතුරේදී කෝටි ගණන් වැය කොට සාධවන ලද ජේතවනාරාමය, ලැබී ඇත. ශනිගේ අන්තර් දශාව අලවි නුවර ගත කොට ඇති බව පෙනේ.

වයස 52 දී කේතු දශාව ලැබීය. කේතුගේ අන්තර් වලදී රෝග සෑදීමත් නින්දා කරදර විඳීමටත් ඉඩ ඇත. මේ කාලයේදී උන්වහන්සේට තත්වයට හා වයස අනුව නොගැලපෙන නොඇසිය යුතු නින්දා අපහාස, ස්ත්‍රී දූෂණ චෝදනා, මිනී මැරුම් චෝදනා, ශරීර තුවාල වීම් ආදිය සිදුවිය.

වයස 59 දී ලැබූ සිකුරු මහ දශාව වටිනා ගෘහවල වාසය හා උසස් සැප ලබාදුන්නත් මාරක යෝග බාරකායාද වීමෙන් කේතු ගේ අතුරු දශාවේදී වයස 80 දී පමණ ආමාශගත රෝගී තත්වයක් යෙදී ආයුෂ අතහැර පිරිණිවන් පා වදාල සේක.

මේ අනුව ජ්‍යොතිශයෙන් ජීවිතය පිළිබඳ කියාදෙන දෑ ප්‍රයෝජනයට ගැනීමෙන්, අවස්ථානෙ-ඊචිතව ජීවන කටයුතු යොදා ගෙන, මග දැන, අතුරු අන්තරා මග හැර, යන ගමනක් සේ ජීවත් වීමට හැකි තත්වයක් උදා කරගත හැකි බව කිව හැකි ය.



# වම් ඉවුරේ මිනිස්සු
### රාජාංගනේ මතක සටහන්

## සැමියා නැති ගෙදර සොර සැමි රති මතයා

වැඩ කටයුත්තක් නොතිබූ ඉරු දිනක් නිසා මිදුල කෙළවර ඇති කොහොඹ ගහ යටට වී ට්‍රැක්ටරයේ ඇති අඩු පාඩු සකසමින් සිටි මට එය නවතන්නට සිදුවුණේ මහා ගෝරනාඩුවක් කරමින් ගෙය දෙසට එන ගැමියා නිසා ය. ඔහු නමින් මුතු බණ්ඩා වුණාත් ගැමියන් සැම දෙනම ඔහු ඇමතුවේ මුත්තප්පා නමින්.

"බොලා කොයින් රාළේ... මෙදා පාරත් කුඹුර බිං වෙනවා... අපට දියවර නැත... අරූ උගේ අවඩි ඉන්න ඉමට නොව දියවර දෙන්නෙ... ඕකා දිවියාම බරු ගහන්ට ඕනෑ.."

"මොකා ගැනද බොල මේ දෙස් තියන්නෙ?"

"මොකා ගැනද ඉතිං දිය බටේ මහතැන් ගැන තමයි"

වැවෙන් දිය බෙදා හරින වාරිමාර්ග නිලධාරියා පිට වේලි වලට හරියාකාරව දිය මුදා නොහැරීම මේ අරෝවට හේතුවයි.

මා ගැමියන් අරගලයට නොයවා මෙය ගොඩින් බේරුමක් කර ගන්නට ඔහු හමුවීමට ගියෙමි. දිය බෙදා හරින පුද්ගලයා සමග කතා කර ප්‍රශ්නය විසදා ගැනීමට හැකි වුණාත් ඔහුගේ ගෝලයා කළ කතාවෙන් මා හා ගිය කොයින් මාමා නම් ආවේ තරහින් පුපුරමින්.

මා දිය අහවර වී කොයින් මාමාට කිට්ටු කළේ මේ කේන්තිය කොයින් මාමාගෙන් තුරන් කිරීමට සුදුසු සැර බීම බෝතලයත් අරගෙනය. පොල් කටුවට දමා ගත් සැර බීම තොල ගාන හැටියෙන් උන්දෑ තාමත් ඉන්නේ කෝපයෙන් බව මට හැඟේ.

"මොකෑ කොයින් මාමා උඹ තවමත් තරහින්? ඒ ඇච්චා කීව දේ කනකට නොගනින්.. ඌ හරියට ලූලා නැති වලට කනයා පණ්ඩිතයා වගේ"

මේක ඇහුව උන්දෑ ඔලොක්කුවට වගේ හිනා වෙලා මගෙන් මෙහෙම ඇහුවා.

"බෝ දන්නවද ඔය කවියේ ඉතුරු හරිය?"

"දන්න හරිය තමයි ඔය දිගේලි කළේ"

"ඕක පා හතරෙ කවියක් කන දී"

තවත් සැර බීම ටිකක් ගිල දාලා උන්දෑ මෙහෙම කිව්වා.

*"බළලා නැති ගෙදර මීයා — හිතුමතයා*
*කොටියා නැති වනයෙ ගෝනා — හිතුමතයා*
*ලූලා නැති වලේ කනයා — පණ්ඩිතයා*
*සැමියා නැති ගෙදර සොර සැමි — රති මතයා*

ඕං ඕක ඔලු ගෙඩිගෙ තියා ගං" කියලා උන්දෑ නැගිටලා ගියා

බෝගල

අපේ උරුමය

# මළ පොතේ අකුර

වී ජී මිගෙල් (සරත්)

මළ පොතේ අකුර කියන්නේ මොන වගේ අකුරක්ද? මට කුඩා කලදීම මේක හරි ප්‍රශ්නයක් උනා. ඒ නිසාම මම රැමේ උගත් දන්නා අඳුනන අයගෙන් මේ ගැන ප්‍රශ්න කළා.

ඇතැම් අ යමට කීවේ මළ පොත කියවනවා කියල කියන්නේ මළ ගෙදරකදී රාත්‍රියේ එළිවන තුරු වෙස්සන්තර ජාතක කාව්‍යය කියවන එකයි. ඒකෙ අකුරු තමා මළ පොතේ අකුරු කියලා.

වේලුණු කොළයක (තල් පතක) ලියවුණ අකුරු මළ පොතේ අකුරු (මළ පත්‍රයේ අකුරු) කියලා.

ඉ සහ ඊ අකුරු වලට ඇල පිළි පාපිළි කිසිවක් එකතු කළ නොහැකි නිසා ඒ අකුරු දෙක මළ පොතේ අකුරු ලෙස තව කෙනෙක් කීවා. නමුත් ඒ කිසිවක් නිවැරදි පිලිතුර නෙවෙයි.



මගේ පියාගේ ඇස් දෙකම නොපෙනුනත් ඔහුට හොඳට ලියන්ට පුලුවන්. ඒ කාලේ අට වෙනි පන්තිය සමත් වෙලා හිටියේ. හත්වැනි පන්තිය සමත් වුණ කෙනෙක් තමයි ළඟ පාසලේ මුල් ගුරුතුමා.

අප්පච්චි මළ පොතේ අකුර ගැන කීවෙ වෙනස්ම කතාවක්. ඒ ගැන දිග ඉතිහාසයකුත් කීවා.

බොහෝම ඉස්සර කාලේ ලංකාවේ මාර්ග පද්ධතිය මෙහෙම දියුණු වෙලා තිබුණෙ නෑ. ඒ කාලයේ කෙනෙකුට තවත් අයෙකුට පණිවිඩයක් යවනවා නම් තවත් කෙනෙක් අතේ බුලත් සමග පණියිඩය යැවිය යුතුයි. (ඒ බුලත් ගැන පසුව කතා කරමු) නැත්නම් තල්පතක ලියා පුහුණු කළ කුරුල්ලකුගේ කකුලේ බැඳ යවා තිබෙනවා. රබන් දෙකක් දෙපැත්තේ සවි කර ඒ දෙක යාවෙන්න කම්බියක් මෙන් නූලක් ගැට ගසා කතා කළ ක්‍රමයකුත් තිබුණා කියනවා.

වේගයෙන් පණිවිඩයක් යැවීමේ ක්‍රමය තමයි ඊ තලයක තල්පත බැඳ විදීම. ඊ තලයක් විදින්න පුලුවන් දුරින් ඊ පොළවල් පිහිටුවලා තිබුණා. එක ඊ පොළක ඉඳන් තව ඊ පොළකට තල් පත විදිනවා. එතැන් බාරව ඉන්නා ඇත්තා ඒ ඊ යමන්ගේ ප්‍රදේශයට අයත් එකක් නම් අදාල අයට එය බාර දෙනවා. නැත්නම් ඒ ඊ ය ඊළඟ ඊ පොළට විදිනවා.

මේ ඊ පොලවල් වල රාජකාරියට ගත්තෙ අකුරු කියවන්න ඉගන ගත් අය නෙවෙයි. මොකද තල් පත් වල රහස් දේ තියෙන නිසා.

මළ ගමක් ගැන ලියවුණ තල්පත් වල පිට පැත්තේ විශේෂිත අකුරක් (සංකේතයක්) ලියනවා. ඒ අකුර දුටු වහාම එය මළ ගමක් පිළිබඳ පණිවුඩයක් බව දැනගෙන් එම තල්පත අදාල තැනට යැවීම ඉක්මන් කරනවා. ඒක හරියට අද කාලේ සීඝ්‍රගාමී තැපෑලට දැම්මා වගේ.

මේ විශේෂිත අකුර නැත්නම් සංකේතය හෝඩි පොතේ අකුරක් වත් ඉගෙන නොගත් හැම දෙනාම දැනගෙන ඉඳලා තියෙනවා. මළ පතේ (මළ ගම ගැන සඳහන් තල්පතේ) ලියන අකුර නිසා මේ අකුරට මළ පොතේ අකුර කියලා කියනවා. ඕනෙම කෙනෙක් ඒ අකුර දන්නා නිසා ඒ අකුර වත් නොදන්නා අයට උපහාසයට කියනවා -අනේ උඹ මළ පොතේ අකුරවත් දන්නෙ නෑනෙ" කියලා.

මේ අකුර සකස් කර තිබෙන්නේ හෝඩියේ අන්තිම අකුර වන ළ යන්න සහ එහි දර්පන ප්‍රතිබිම්මබය එක් කිරීමෙනියු. අකුරක් යයි කීවාට මෙ ඇත්තෙන්ම ලාංඡනයක් කියා කිව්වොත් වඩා නිවැරදියි.